# ථේරීගාථා තුළින් ඉස්මතුවන භාරතීය කාන්තාවගේ සමාජීය පසුබිම පිළිබඳ විමර්ශනයක්

**අංජලිකා ඒ.ඒ.ජී,[1] අයිරාංගනි එම්.කේ.එල්.[2]**

ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ කාන්තා අයිතිවාසිකම් වත්මන් සමාජ කතිකාවතෙහි ප්‍රධානතම මාතෘකාවකි. එයට හේතු වී ඇත්තේ ස්ත්‍රියගේ අයිතිවාසිකම් උදෙසා ඇය විසින් මතුකරන හඬ හා ඇගේ බහුවිධ සමාජීයය කාර්යභාරයට නිසි වටිනාකමක් හා ඇගයීමක් ලබා ගැනීමට දරන නිරන්තර උත්සාහය යි. භාරතීය ඉතිහාසයේ විවිධ යුගයන් අධ්‍යයනය කිරීමේ දී කාන්තාවට විවිධ සමාජ අභියෝගයන් හට මුහුණ දීමට සිදු වී ඇති ආකාරය හඳුනාගත හැකි ය. ථේරීගාථා පාළිය තුළින් ඉස්මතුවන බුද්ධකාලීන භාරතීය කාන්තාවගේ සමාජීයය පසුබිම අධ්‍යයනය කිරීම අරමුණු කරගත් මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික මෙන් ම ද්විතීයික මූලාශ්‍රයගත දත්ත භාවිත කරන ලද අතර ඓතිහාසික සංසන්ධනාත්මක ක්‍රමවේදය යටතේ දත්ත විශ්ලේෂණය කරන ලදී. එහිදී සම්මුඛ සාකච්ඡා මෙන් ම ථේරීගාථා පාළිය, සද්ධර්මාලංකාරය, අමාවතුර, සීලප්පදිකාරම් ආදී වූ මූලාශ්‍රයයන් ද, පූර්ව පර්යේෂණ ග්‍රන්ථ, පුවත්පත් සහ සඟරා තුළින් ලබාගත් තොරතුරු ද සංසන්දනාත්මක ව අධ්‍යයනයට ලක්කරනු ලැබී ය. භාරත ඉතිහාසයේ වෛදික අවධිය වන විට කාන්තාවට ඉහළ සමාජීය තත්ත්වයන් හිමි වූ අතර පශ්චාත් වෛදික යුගය වනවිට එය ක්‍රමයෙන් අඩු වී පුරුෂ පක්ෂය යටතේ පමණක් ජීවත්වන වහලියක ලෙසට තම ජීවන ගමන ගෙනයාමට සිදුවී තිබුණි. මෙම තත්ත්වය බුද්ධ කාලීන සමාජය දක්වා පැවති ඇති බව සමකාලීන ව රචනා වූ 'ථේරීගාථා පාළිය' මූලාශ්‍රයෙන් හඳුනාගත හැකි වෙයි. ථෙරීගාථා පාළියෙහි බුද්ධකාලීන භික්ෂුණීන් වහන්සේලාගේ ගිහිජීවිතයේ දී මුහුණදුන් අභියෝග, අරගල සහ ජයග්‍රහණයන් අන්තර්ගත වෙයි. ධෛර්යය සම්පන්න කාන්තාවන්ගේ ගැඹුරු ජීවන පැතිකඩක් නිරූපණය කරන මෙය හද කම්පා කරවන සංවේදී සිදුවීම් ගණනාවකින් යුතු සාහිත්‍යමය සහ ඓතිහාසික වටිනාකමකින් යුතු ග්‍රන්ථයකි. ථේරී ගාථා තුළින් බුදුදහමේ එන සුවිශේෂී චරිත වන පටාචාරා, කිසාගෝතමී යන අයගේ ද අම්බපාලි, විමලා වැනි නගර ශෝභිණියන්ගේ ද, සුමේධා, සේලා වැනි රාජකීය කාන්තාවන්ගේ ද, කුණ්ඩලකේශි, සුජාතා, වැනි වෙළෙඳ පවුල්වල අයවලුගේ ද මුත්තා වැනි දිළිඳු අයවලුන්ගේ සමාජ චර්යාවන් සහ ඔවුන්ට හිමි සමාජ තත්ත්වය ද හෙළිකරයි. පුරුෂ ආධිපත්‍යය හේතුවෙන් ගෘහස්ථය තුළ කාන්තාව විඳි හිංසනය, වෘත්තිමය ජිවිතය තුළ ඇය සිදු කළ දාස සේවය, ගණිකා වෘත්තිය ආදි වෘත්තීන් ද, ආර්ථිකමය දුෂ්කරතා හේතුවෙන් කාන්තාවට හිමි නිසිතැන අහිමි වී තිබූ බව ද, දියණියක, බිරිඳක, වැන්දඹුවක ලෙස පුරුෂාධිපත්‍යයෙන් පෙලුනා මෙන් ම කුල භේදයන්, ඇදහිලි හා සිරිත් විරිත් මඟින් එකල කාන්තාවට හිමි වූ පහත් සමාජ තත්ත්වය පිළිබඳ පැතිකඩ ගණනාවක් මේ තුළින් නිරූපණය වේ. මේ අනුව මෙම ග්‍රන්ථය බුද්ධකාලීන භාරතීය සමාජයේ කාන්තාවගේ සමාජීයය පසුබිම අවලෝකනය කරන කැඩපතක් බඳු ය.

**ප්‍රමුඛ පද :** ථෙරීගාථා, බුද්ධකාලීන භාරතය, කාන්තාව, සමාජීයය පසුබිම, සද්ධර්මාලංකාරය

[1]මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. anjuathukorala4@gmail.com